# දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම

## රැස්වීම් වාර්තාව

1. දිනය - 2022.09.27 වේලාව - පෙ.ව. 9.30
2. ස්ථානය - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ඒ.අයි. වික්‍රම ශ්‍රවණාගාරය
3. ප්‍රධානත්වය - දිස්ත්‍රික් සම්බන්ධීකරණ සභාපති දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු. ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා
4. මෙහෙයවීම - දිස්ත්‍රික් ලේකම් ජේ.එම්.ඒ. ඩග්ලස් මහතා
5. සහභාගීත්වය

| අනු අංකය | නම | තනතුර | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ ආයතනය |
|---|---|---|---|
| 1 | ගරු ඩී. වීරසිංහ මහතා | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී /දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති | |
| 2 | ගරු. විමලවීර දිසානායක මහතා | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 3 | ගරු. ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 4 | ගරු ටී කලෙයරසන්මහතා | ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී | |
| 5 | තුසිත පී වනිගසිංහ මහතා | පළාත් ප්‍රධාන ලේකම් | ප්‍රධාන ලේකම් කාර්යාලය (නැගෙනහිර පළාත) |
| 6 | ජේ.එම්.ඒ.ඩග්ලස් මහතා | දිසාපති/දිස්ත්‍රික් ලේකම් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| 7 | වී. ජෙගදීසන් මහතා | අතිරේක දිස්ත්‍රික් ලේකම් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| 8 | එච්.එස්.එන්. ද සොයිසා මහතා | අතිරේක දිස්ත්‍රික් ලේකම් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| 9 | ටී.මෝහන්කුමාර් මහතා | අධ්‍යක්ෂ සැලසුම් | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| 10 | එස්.එල්.ආදම්බාවා මහතා | ප්‍රධාන ගණකාධිකාරී | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| 11 | එච්.බී.අනීස් මහතා | නියෝජ්‍ය සැලසුම් අධ්‍යක්ෂ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| 12 | එන්.රමේෂ් මයා | ප්‍රධාන අභ්‍යන්තර විගණක | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |
| 13 | ජේ.ජේ.මුරලිදරන් මිය | ලේකම් | සෞඛ්‍ය අමාත්‍යාංශය - නැ.ප. |
| 14 | ජේ.ඒ.සුදත් මයා | සභාපති | ප්‍රාදේශීය සභාව, දෙහිඅත්තකණ්ඩිය |
| 15 | ජේ.ඒ.මංගල මයා | සභාපති | ප්‍රාදේශීය සභාව, දමන |
| 16 | ජේ ලියකාත් අලි මයා | ප්‍රාදේශීය ලේකම් | කල්මුණ |
| 17 | එස්.සී.එම්.හනීෆා මයා | ප්‍රාදේශීය ලේකම් | සම්මන්තුරේ |
| 18 | සඳරුවන් අනුරුද්ධ මයා | ප්‍රාදේශීය ලේකම් | අම්පාර |
| 19 | එස්. රන්ගනාදන් මයා | ප්‍රාදේශීය ලේකම් | නාවිදන්වෙලි |
| 20 | ඒ.එම්.අබ්දුල් ලතීෆ් මයා | ප්‍රාදේශීය ලේකම් | නින්දවූර් |
| 21 | එස්.ටී.ප්‍රියංකා වීරසිංහ මයා | ප්‍රාදේශීය ලේකම් | දෙහිඅත්තකණ්ඩිය |
| 22 | උදාර නානායක්කාර මයා | ප්‍රාදේශිය ලේකම් | උහන |
| 23 | බී.වී.එස්.ගුණසේන මයා | ප්‍රාදේශිය ලේකම් | පදියතලාව |
| 24 | ටී.ජේ.අදිසෙයරාජා මයා | ප්‍රාදේශිය ලේකම් | කල්මුණ උතුර |
| 25 | එන්.නවනීතරාජා මයා | ප්‍රාදේශිය ලේකම් | ලාහුගල |
| 26 | එස්.ජගරාජන් මයා | ප්‍රාදේශිය ලේකම් | කාරතිවු |
| 27 | ආර්.එම්.ඩී.ජේ.රත්නායක මයා | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | අම්පාර |
| 28 | එස්.එම්.එම්.සෆ්රාස් මයා | සමෘද්ධි අධ්‍යක්ෂ | දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය, අම්පාර. |
| 29 | ජී.එම්.එම්.ආර් බණ්ඩාර මයා | මූලස්ථාන පොලිස් පරීක්ෂක | පොලිස් ස්ථානය අම්පාර. |
| 30 | කේ.ජී.නලින් පෙරේරා මයා | සහකාර පොලිස් අධිකාරී | විශේෂ කාර්යය බලකාය, අම්පාර. |
| 31 | පී.චන්ද්‍රන කුමාර මයා | ප්‍රධාන පොලිස් පරීක්ෂක | විශේෂ කාර්යය බලකාය, අම්පාර |
| 32 | කේ.ජී.අයි.මධුරංගනී මිය | දිස්ත්‍රික් නිලධාරී | සිවිල් ආරක්ෂක බලකාය |
| 33 | එස්.සුල්පිටර් මයා | දිස්ත්‍රික් නිලධාරී | සිවිල් ආරක්ෂක බලකාය |
| 34 | ආර් සී.රණසිංහ මයා | දිස්ත්‍රික් නිලධාරී | සිවිල් ආරක්ෂක බලකාය |

| | | | |
|---|---|---|---|
| 35 | රුවන් ගම්හේවා මයා | පරිපාලන නිලධාරී | නිවාස සංවර්ධන අධිකාරිය |
| 36 | වෛද්‍ය ඩබ්.ජී.එස්.සංජීවනි මිය | පශු වෛද්‍ය | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| 37 | එස්.එල්.ඒ.රූපසිංහ මයා | හිටපු මෙහෙයුම් නිලධාරී | ගල්ඔය |
| 38 | එච්.ආර්.ඩබ්. ද සිල්වා මයා | අණදෙන නිලධාරී | ගුවන් හමුදාව |
| 39 | එම්.එස්.එම්.අන්සාර් මයා | සහකාර කම්කරු කොමසාරිස් | කම්කරු කාර්යාලය, අම්පාර. |
| 40 | ඩබ්.කේ.එම්.එස්.පී.බණ්ඩාර මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ, | කාර්මික සංවර්ධන මණ්ඩලය |
| 41 | ජෙසින්තා අරුනාලන් මිය | අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ | පළාත් අධ්‍යාපන කාර්යාලය |
| 42 | ඒ.එන්.මහේදන් මයා | තොරතුරු තාක්ෂණ නිලධාරී | ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය |
| 43 | ආර්.එම්.බී.මැණිකේ මිය | කළමණාකරණ සේවා නිලධාරී | ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය |
| 44 | බී.එල්.පී.යූ.සිල්වා මයා | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාර | මිනින්දෝරු දෙපාර්තමේන්තුව. අම්පාර. |
| 45 | කේ.එස්.තුෂාර පෙරේරා මයා | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ, | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, අම්පාර (බීජ) |
| 46 | එම්.එල්.ඒ.සානීර් මයා | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ, | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, අම්පාර |
| 47 | ඩී.එම්.කුමාර මයා | සහකාර අධ්‍යක්ෂක වෙනුවට | වනජීවී දෙපාර්තමේන්තුව |
| 48 | එම්.අයි.එම්.රයීල් මයා | දිස්ත්‍රික් ඉංජිනේරු | දිස්ත්‍රික් ලේකම්කාර්යාලය, අම්පාර |
| 49 | ඉංජි.ඒ.රාජේෂ්ඛනනා මයා | වාරිමාර්ග ඉංජිනේරු(පළාත්) | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 50 | ඉංජි.ජේ.ඒ.අකීල් මයා | වාරිමාර්ග ඉංජිනේරු(පළාත්) | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 51 | ඒ.එම්. නාජත් මයා | සහකාර අධ්‍යක්ෂ | ධීවර දෙපාර්තමේන්තුව, කල්මුණ. |
| 52 | ආර්.ටී.ප්‍රියදර්ශන මයා | සංවර්ධන නිලධාරී | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 53 | එම්.එස්.ඒ. කලීස් මයා | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ | දිස්ත්‍රික් ලේකම්කාර්යාලය, අම්පාර |
| 54 | එම්.ලෝහිස් මයා | ව්‍යාපෘති ඉංජිනේරු | මාර්ග සංවර්ධන අධිකාරය(අයි-රෝඩ්) |
| 55 | පී.උදයරන්ජන් මයා | ප්‍රාදේශීය කළමනාකරු | පොල් වගාකිරීමේ මණ්ඩලය, අම්පාර. |
| 56 | එම්.අයි.එම්.හසීබ් මයා | වැඩ අධීක්ෂන නිලධාරී | අග්නිදිග විශ්ව විද්‍යාලය |
| 57 | එස්.එල්.ඒ.කේ. නෙත්මිණ මයා | සහකාර පළාත් පාලන කොමසාරිස් | සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය |
| 58 | සමන් වීරසිංහ මයා | ව්‍යාපෘති අධ්‍යක්ෂ | වාරිමාර්ග දෙපාර්තමේන්තුව. |
| 59 | ඒ.එල්. ඔස්මන් ද සිල්වා මයා | නේවාසික ව්‍යාපෘති කළමනාකරු | රඹකැන්ඔය කලාපය, මහඔය. |
| 60 | එම්.ආර්.එම්.ෆාරිස් මයා | ප්‍රාදේශීය ඉංජිනේරු | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, අම්පාර. |
| 61 | එම්. රාසමෝහන් මයා | පුහුණු නිලධාරී | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය |
| 62 | එම්.එම්.ඒ. සුල්ෆිකාර් මයා | විධායක ඉංජිනේරු | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව, අම්පාර. |
| 63 | එල්.පී.චාමිනි සෝමදාස මිය | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් | ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය |
| 64 | මුදිතා ගොඩෙල්ලවත්ත මිය | සහකාර අධ්‍යක්ෂක | ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුව(සැලසුම්) |
| 65 | එස්.ඩබ්.කුමාරසිංහ මයා | සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් | සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය |
| 66 | කේ.ශිවකුමාර් මයා | දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරී | දිස්ත්‍රික් සමාජ සේවා කාර්යාලය |
| 67 | යූ.කේ.එම්.මුසාජිත් මයා | ප්‍රාදේශීය කළමණාකරු | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (අම්පාර |
| 68 | ජේ.ඒ.ලියනගේ මයා | මාර්ග කළමණාකරු | නවලෝක ඉදිකිරීම් |
| 69 | ඩබ්.එම්.ඒ.ජේ.ප්‍රනාන්දු මයා | ව්‍යාපෘති කළමණාකරු | නවලෝක ඉදිකිරීම් |
| 70 | පී.ජී.එල්.සී.කුමාරසිරි මයා | පළාත් අධ්‍යක්ෂ | බහුකාර්ය සංවර්ධන බලකාය |
| 71 | ආර්.එස්.එම්.සී.සේනානායක මයා | සහකාර අධ්‍යක්ෂ | බහුකාර්ය සංවර්ධන බලකාය |
| 72 | එච්.කේ.එස්.ගුණරත්න මයා | සහකාර කළමණාකරු | මහජන බැංකුව |
| 73 | කේ.එල්.එම්.මුසම්මිල් මහතා | මුලස්ථාන ඉඩම් නිලධාරී | පළාත් ඉඩම් කාර්යාලය |

| | | | |
|---|---|---|---|
| 74 | එන්.මල්ලවාරච්චි මයා | දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛනඥ | සංඛ්‍යාලේඛන අංශය |
| 75 | ආර්. සුවාකර් මයා | සහකාර ප්‍රාදේශීය ලේකම් | ආලයඩිවේම්බු |
| 76 | මොහාන් අබේසුන්දර මයා | පරීක්ෂක | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය |
| 77 | එච්.එම්.පී.ජයරත්න මයා | ISA | අධ්‍යාපන |
| 78 | වී.ටී.සම්බන්තර් මයා | සහකාර ඉංජිනේරු | ලංකා විදුලිබල මණ්ඩලය, කල්මුණ |
| 79 | වයි.එම්.එස්.එස්.යාපා මයා | නේවාසික ප්‍රාදේශීය කලමණාකරු | නේවාසික ව්‍යාපෘති කලමණාකරණ අංශය |
| 80 | ඩබ්.ඒ.වික්‍රමරත්න මයා | | වෙරළ සංරක්ෂන දෙපාර්තමේන්තුව |
| 81 | එන්.ජුඩ් ක්‍රිෂාන්ත් මයා | සහකාර ලේකම් | CSIAP ව්‍යාපෘතිය (නැගෙනහිර පලාත) |
| 82 | ජී.අබ්දුල්හාන් මයා | | CSIAP ව්‍යාපෘතිය (නැගෙනහිර පලාත) |
| 83 | ඩී.එම්.බී.ජේ.බී. දිසානායක මයා | නියෝජ්‍ය ව්‍යාපෘති කලමණාකරු | AMSK ඉදිකිරීම් සමාගම |
| 84 | වසන්ත රහසිංහ මයා | ව්‍යාපෘති කළමණාකරු | AMSK ඉදිකිරීම් සමාගම |
| 85 | එස්.එච්.එල්.දයාපාල මයා | නේවාසික ප්‍රාදේශීය කලමණාකරු | නේවාසික ව්‍යාපෘති කලමණාකරණ අංශය |
| 86 | කේ.ශිවකුමාර් මයා | දිස්ත්‍රික් සමුද්‍රීය පරිසර නිලධාරි | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය |
| 87 | ආර්.එම්. විජයපාල මයා | දිසා වන නිලධාරී | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව. අම්පාර. |
| 88 | එම්.අයි.නහ්මුදීන් මයා | විධායක ඉංජිනේරු | මාර්ග සංවර්ධන අධිකාරය, අම්පාර |
| 89 | කේ.එල්.එම්.ඉස්මයිල් මයා | ප්‍රධාන ඉංජිනේරු | මාර්ග සංවර්ධන අධිකාරය, අම්පාර |
| 90 | එම්.අයි.එම්.රියාස් මයා | | මාර්ග සංවර්ධන අධිකාරය, අක්කරපත්තුව |
| 91 | ඒ.එම්.උවයිස් මයා | ව්‍යාපෘති ඉංජිනේරු | මාර්ග සංවර්ධන අධිකාරය, |
| 92 | ඉසෙඩ්.ඒ.එම්.අස්මීර් මයා | විධායක ඉංජිනේරු | මාර්ග සංවර්ධන අධිකාරය |
| 93 | ටී. සිවසුබ්‍රමනියම් මයා | විධායක ඉංජිනේරු | මාර්ග සංවර්ධන අධිකාරය |
| 94 | ජී.ඩී.ඩී.ලක්මාල් මයා | ඉංජිනේරු | මාර්ග සංවර්ධන අධිකාරය |
| 95 | ඉංජි.එම්.ආර්.සෙනෙවිරත්න මයා | ප්‍රධාන ඉංජිනේරු | මාර්ග සංවර්ධන අධිකාරය, (අයි රෝඩ් ව්‍යාපෘතිය) |
| 96 | සුදත් ගමගේ මයා | වාරිමාර්ග අධ්‍යක්ෂ | වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය, අම්පාර. |
| 97 | ආර්. සී.සමන් කුමාර මයා | නියෝජ්‍ය ප්‍රාදේශීය කළමණාකරු | දැව සංස්ථාව |
| 98 | ටී.පත්මරාජා මයා | ව්‍යාපෘති අධ්‍යක්ෂ | අයි රෝඩ් ව්‍යාපෘතිය. |
| 99 | යූ.සී.එම්.සාජිත් මයා | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය, කල්මුණ. |
| 100 | ඉංජි.පී.අච්න්ත මයා | ප්‍රධාන ඉංජිනේරු | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, |
| 101 | එෆ්.ෂාරීෆා ජාහන් මයා | සංවර්ධන නිලධාරි | කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය |
| 102 | ඩබ්.කේ.අයි.ප්‍රනාන්දු මයා | සහකාර නේවාසික ඉංජිනේරු(වැඩබලන) | අයි- රෝඩ් උපදේශන කාර්යාලය |
| 103 | එස්.ත්‍යාගරාජා මයා | අධ්‍යක්ෂ | හාඩි කාර්මික තාක්ෂණ ආයතනය |
| 104 | වෛද්‍ය එම්.ඒ.නදීර් මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| 105 | එස්.සතීෂ් කුමාර් මයා | සහකාර අධ්‍යක්ෂ | කෘෂි රක්ෂණ මණ්ඩලය |
| 106 | ඩබ්.ඒ.සී.එස්.දමයන්ති මිය | සහකාර අධ්‍යක්ෂ | ජාතික තරුණ සේවා සභාව |
| 107 | කේ.ටී.එස්.කුමාර මයා | ප්‍රධාන කළමනාකරු | ගල්ඔය වැවිලි සමාගම |
| 108 | එච්.එම්.ඒ.බණ්ඩාර මයා | ප්‍රධාන කළමනාකරු | ගල්ඔය වැවිලි සමාගම |
| 109 | බී.ජී.සෙනෙවිරත්න මයා | නියෝජ්‍ය ප්‍රාදේශීය ව්‍යාපෘති කලමණාකරු | මහවැලි අධිකාරිය. |
| 110 | ජේ.ඒ.සුදත් මයා | සභාපති | ප්‍රාදේශීය සභාව දෙහිඅත්තකණ්ඩිය |
| 111 | පී.ඩී.එස්.ඩී.හේමකුමාර මයා | ඩිපෝ කලමණාකරු | ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය |
| 112 | කේ.කැලුම් කුමාර මයා | සභාපති | අම්පාර නගර සභාව |
| 113 | ආර්.ඥාණසෙල්වම් මයා | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය |
| 114 | ඒ. අරුණන්ත් මිය | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය |
| 115 | කේ. පාස්කරාතස් මයා | කෘෂිකර්ම විද්‍යාඥ | කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය |

| | | | |
|---|---|---|---|
| 116 | ඒ.පී.අයිරාංගනී මිය | දිස්ත්‍රික් කළමනාකරු | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අම්පාර |
| 117 | ඒ.සී.මොහොමඩ් ෆාහිම් මයා | සහකාර ඉංජිනේරු | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අම්පාර |
| 118 | එම්.එම්.ගොඩැල්ලවත්ත | සහකාර අධ්‍යක්ෂ(දි.ඉ.ප) | ඉඩම් පරිහරන (සැලසුම්) |
| 119 | වෛද්‍ය උපුල් විජේනායක මයා | වෛද්‍ය අධිකාරී | මූලික රෝහල (අම්පාර) |
| 120 | වෛද්‍ය එම්.එච්.එම්.අසාත් මයා | වෛද්‍ය අධිකාරී | මූලික රෝහල - අක්කරපත්තුව |
| 121 | යූ.එල්.ඒ.නසාර් මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | වාරිමාර්ග දෙපාර්තමේන්තුව (පළාත්) කාර්යාලය - කල්මුණ |
| 122 | ඩී.එම්.එස්.බී.දිසානායක මයා | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (පළාත්) |
| 123 | පී.විභර්නන් මයා | වාරිමාර්ග ඉංජිනේරු | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 124 | එස්.ආර්.හසන්ති මිය | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය, අම්පාර. |
| 125 | ඒ.ජී.ෆාස්මිල් මයා | නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය, අක්කරපත්තුව |
| 126 | ජී.කේ.සී.කරුණාරත්න මයා | බලාත්මක තක්සේරුකරු | නාගරික සංවර්ධන අධිකාරිය |
| 127 | එම්.එස්.එම්.රසාන් මයා | ප්‍රාදේශීය ලේකම් | එරගම |
| 128 | එන්. නයිරෝස්කාන් මයා | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | සම්මන්තුර කලාප අධ්‍යාපන කාර්යාලය. |
| 129 | එම්.එම්.මුනාස් මයා | විධායක ඉංජිනේරු | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තු |
| 130 | එල්.එම්.එම්. අන්සාර් මයා | ප්‍රාදේශීය ලේකම් | අක්කරපත්තු |
| 131 | එම්.ඒ.සී.එම්.රියාස් මයා | සහකාර අධ්‍යක්ෂ | දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය. |
| 132 | වෛද්‍ය එන්.බී.එම්.ෆේරෝස් මිය. | වෛද්‍ය නිලධාරී (සැලසුම්) | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, අම්පාර. |
| 133 | වෛද්‍ය එම්.එච්.එම්.රිස්වින් මයා | වෛද්‍ය අධිකාරී | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය |
| 134 | වෛද්‍ය වී.වී.ටී.නතේෂ් මහතා | වෛද්‍ය නිලධාරී (සැලසුම්) | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, අම්පාර |
| 135 | ජේ.ලියාකත් අලි මහතා | ප්‍රාදේශීය ලේකම් | කල්මුණ |
| 136 | ඒ.එම්.ප්‍රියන්ත බණ්ඩාර මයා | සහකාර අධ්‍යක්ෂ | ජාතික පොහොර ලේකම් කාර්යාලය |
| 137 | සනත් වසන්ත මහතා | සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් | සමූ පකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය |
| 138 | ඩබ්.ඒ.කේ.ආර්.ප්‍රනාන්දු මයා | සහකාර අධ්‍යක්ෂ | ජලජීවී දෙපාර්තමේන්තුව |
| 139 | එම්.එම්. අසීම් මයා | ප්‍රාදේශීය ලේකම් | සම්මන්තුර |
| 140 | ටී.ගජේන්ද්‍රන් මයා | ප්‍රාදේශීය ලේකම් | තිරුක්කෝවිල් |
| 141 | පී.පරමාත්යලන් මයා | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය තිරුක්කෝවිල් |
| 142 | පී.රාසමෝහන් මයා | ප්‍රධාන ඉංජිනේරු | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව (අම්පාර) |
| 143 | එස්.උදයරාජන් මයා | සහකාර අධ්‍යක්ෂ | මධ්‍යම පරිසර අධිකාරිය, අම්පාර. |
| 144 | ඒ.සී.හානූ මිය | ඉඩම් කොමසාරිස් | ඉඩම් කොමසාරිස් කාර්යාලය, අම්පාර |
| 145 | එස්.පී.එස්.ජයතිස්ස මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | නාගරික සංවර්ධන අධිකාරිය (අම්පාර) |
| 146 | එම්.එන්.මදුමාලි මිය | සංවර්ධන නිලධාරී | කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය |
| 147 | එම්.අයි.එම්.නව්ෆර් මයා | සහකාර ඉංජිනේරු | ලංකා විදුලිබල මණ්ඩලය |
| 148 | එම්.සී.ජලාල්ධීර් මයා | සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් | සමූ පකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය (කල්මුණ) |
| 149 | ඉංජී.ඩබ්.ඒ.කේ.ජේ.පෙරේරා | ප්‍රාදේශීය කළමනාකරු | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (අම්පාර) |

06. නොපැමිණීම

| අනු අංකය | නම | තනතුර | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ ආයතනය |
|---|---|---|---|
| 1 | | ආණ්ඩුකාර තුමිය | නැගෙනහිර පළාත් සභාව. |
| 2 | ගරු. පා.ම.වෛද්‍ය තිලක් රාජපක්ෂ | පාර්ලිමේන්තු මන්ත්‍රී | පාර්ලිමේන්තුව |
| 3 | ගරු පා.ම එස්.එම්.එම්.මුෂාරෆ් මහතා | පාර්ලිමේන්තු මන්ත්‍රී | පාර්ලිමේන්තුව |
| 4 | ගරු. පා.ම ෆයිසර් කාසිම් මහතා | පාර්ලිමේන්තු මන්ත්‍රී | පාර්ලිමේන්තුව |
| 5 | | ආණ්ඩුකාර ලේකම්, | නැගෙනහිර පළාත් සභාව. |
| 6 | | ලේකම්, | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය. |

07. පිළිගැනීම හා අරමුණ පැහැදිලි කිරීම. - ජේ.එම්.ඒ. ඩග්ලස් මහතා , දිස්ත්‍රික් ලේකම්/දිසාපතිතුමන් විසින් දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව අමතමින්, මුලින්ම පැමිණ සිටි ගරු සභාපතිතුමා, සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා ප්‍රධාන ලේකම් ඇතුලු සහභාගී වූ සියලුම නිලධාරීන් ඉතා සුහදව පිළිගන්නා ලදි. තව ද නව දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු සභාපති තුමාගේ නව තනතුරට සුභාශිංශන ද එක් කලේය.

ගරු. සභාපතිතුමන් වෙත ගරු සභාවේ කටයුතු භාර දීමෙන් අනතුරුව පැමිණ සිටි අය නැවත පිළිගනිමින් සභාවේ කටයුතු ආරම්භ කරන ලදි. එහි දී රජය හෝ රාජ්‍ය නොවන සංවිධාන හරහා සිදු කරනු ලබන සංවර්ධන කටයුතු පිළිබඳ දේශපාලන අධිකාරියට හා දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවට දන්වන ලෙස ද ඉල්ලන ලදි. තව ද මින් ඉදිරියට ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවේ සාකච්ඡා කර විසදුම් නොලැබුණු ගැටලු පමණක් නැවත දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවේ දි සාකච්ඡා කරන බව දන්වන ලදි.

දිසාපතිතුමන් විසින් ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් ජනාධිපති කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන පිලිබඳව පැහැදිලි කිරීමක් කරන ලදි. තව ද අපනයන අභිමුඛ ව්‍යාපාර ආරම්භ කිරීමට මූලික විය යුතු බව ද තවදුරටත් පවසන ලදි.

08. ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන ප්‍රධාන සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය

8.1. ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීමේ වැඩසටහන

i. ආර්ථික සුරක්ෂිතතාවය:

a. කෘෂිකර්මය : දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක විසින් බිම් සකස් කිරීම් සම්බන්ධව හා බඩ ඉරිඟු වගාවට ඉන්ධන අවශ්‍යතාවක් තිබෙන බවත් මහ කන්නයේ වී වගාව හෙක්ටයාර් 88000 ක හා බඩ ඉරිඟු හෙක්ටයාර් 16000 කට සැලසුම් කර ඇති බවත් ඒ සඳහා අවශ්‍ය ඉන්ධන ක්‍රමවේදය ඉල්ලීම් කර ඇති බව ද දන්වන ලදි.

දිසාපතිතුමන් විසින් යල කන්නයේ දී ඉන්ධන හිඟයකට මුහුණ දුන්න ද හෙක්ටයාර් 64000 ක අස්වැන්නක් ලැබුණු බව ද අක්කරයක අස්වැන්න 40% අඩුවීමක් දක්නට ලැබුණු බව ද පැවසීය.

ගොවිජන කොමසාරිස්තුමිය විසින් මහ කන්නය සඳහා 70% රසායනික පොහොර හා 30% ක කාබනික පොහොර වී වගාවක් පවත්වා ගෙන යාමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිර්දේශය වන බවත් වී වගා කර පළමු සති දෙක සඳහා කෘෂි දෙපාර්තමේන්තුවේ නිර්දේශය වන හෙක්ටයාර 1ක් සඳහා යූරියා 35kg බව ද පැවසීය. එය දැනටමත් අම්පාර ගොවිජන සේවා කාර්යාලය වෙතට ලැබී ඇති බවත් බෙදාහැරීම කරනු ලබන බව ද පැවසීය.

පොහොර සපයන සමාගම් අතරින් තම සේවාව නිසියාකාරව ලබා නොදෙන ආයතනයක් සම්බන්ධව පැමිණිලි ලැබී ඇති බව හා එම සමාගම සම්බන්ධ විස්තර ලබා දෙන ලෙසට දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු සභාපතිතුමන් විසින් විමසූ අවස්ථාවේ දී ගොවිජන සංවර්ධන කොමසාරිස්තුමිය විසින් මින් පෙර එම ආයතනය සම්බන්ධව දැනුම්දුන් නමුත් නැවත වරක් එම සමාගම පොහොර සපයන සමාගම් අතරට ඇතුලත් කර ඇති බවත් දැන්විය. පසුගිය දිනෙක පැවැත් වූ කෘෂිකර්මය සම්බන්ධ රැස්වීමේ දී මෙම ආයතනයට මෙම කන්නයේ දී පොහොර සැපයීම පිළිබඳ අධීක්ෂණය කර නැවත අවස්ථාවක් ලබා දීම සම්බන්ධව තිරණය කරන බවට පැවසූ බව දිසාපතිතුමන් විසින් පැවසීය. තව ද ගොවිජන කොමසාරිස්තුමියට පොහොර සපයන ආයතනවල නාම ලේඛනය සභාපතිතුමන් වෙත ලබා දෙන ලෙසට දැන්විය.

කන්න රැස්වීම් සියල්ල ඔක්තෝම්බර් 15 දින වන විට පවත්වා අවසන් කරන බැවින් ඔක්තෝම්බර් 10වන දා වන විට පොහොර ලැබිය යුතු බව සමාගම්වලට දන්වන ලෙස කමිටුව විසින් තීරණය කරන ලදි. තව ද එම දිනය වන විට පොහොර සැපයීමට නොහැකි වූ ආයතන සඳහා ඇනවුම් නතර කරන ලෙසටද , අසාර්ථක වූ පොහොර සපයන සමාගම සම්බන්ධව තීරණයක් ගත යුතු බව ද දන්වන ලදි. එහි දී ඔක්තෝම්බර් 11වන දින කෘෂිකර්මයට සම්බන්ධ නිලධාරීන්ගේ රැස්වීමක් පැවැත්වීමට තීරණය කරන ලදි

කෘෂිකර්ම අධ්‍යක්ෂක, ගොවිජන කොමසාරිස් එකතුව වී වගාවත් සමඟම ගොඩ ඉඩම් වල මිරිස් වගාව වැනි වගාවන් දියුණු කිරීම සම්බන්ධව අවධානය යොමු කල යුතු බවද ඒකාබද්ධ ගොවිපළ යන සංකල්පය ක්‍රියාත්මක කිරීම පිළිබඳ අවධානය යොමු කල යුතු බව ද දැන්වීය. බීජ තොග සම්බන්ධව හා කිරි ගොවිපල දියුණු කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවා ද යන්න ගරු. පා.ම. ඒ.එල්.එම්.අතාවුල්ලා මහතා තවදුරටත් විමසීය.

ග්‍රාමීය කේන්ද්‍ර කමිටු පිහිටුවා මෙම ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම විධිමත් කල යුතු බව පළාත් ප්‍රධාන ලේකම් විසින් පැවසීය.

යල කන්නයේ දී මිරිස් වගාව සිදු කල බවත් කුකුල් තැම දිස්ත්‍රික්කයේම නිෂ්පාදනය කිරීමට අවස්ථාවක් ඇත්නම් ඒ සඳහා යොමු යුතු විය යුතු බව ත් දිසාපතිතුමන් විසින් පවසන ලදි.

මේ වන විට බඩ ඉරිඟු බීජ 50,000 kg පමණ තිබෙන බවත් අනෙකුත් බීජ වල හිඟතාවයක් නොමැති බවත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා (බීජ හා රෝපණ) විසින් පැවසීය.

b. ධීවර : මත්ස්‍ය අභිජනනය සඳහා විදුලිය අවශ්‍ය බව ද වැව තුල පිහිටි ස්වභාවික අභිජනන ප්‍රදේශ අනවසර ධීවර කටයුතු හේතුවෙන් හානියට පත්වන බැවින් එය වැළැක්වීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ද ජලජීවී සහකාර අධ්‍යක්ෂතුමා විසින් ඉල්ලීම්කරන ලදි. ඒ සඳහා සහයෝගය ලබා දෙන ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමාට කමිටුව මඟින් දැන්විය.

c. **පශු සම්පත් :** අතිරේක පලාත් අධ්‍යක්ෂක විසින් කුකුල් පැටව් නිෂ්පාදනය කිරීමට හැකියාව ඇති බවත් කිරි ගවයන් සම්බන්ධයෙන් සුදු ගවයන් අභිජනනය වැඩි දියුණු කිරීමට සැලසුම් සකස් කර ඇති බව ද දැන්විය
එක් කිරිගවයෙකුගෙන් කිරි ලීටර් 3 ½ක් ලබා ගැනීමට උත්සහා දැරීම මඟින් කිරි කර්මාන්තය දිස්ත්‍රික්කයේ ස්වයං පෝෂිත කිරීමට හැකි බව දිසාපතිතුමන් විසින් පැවසූ අතර ගවගාල් ගත කිරීමට සුදුසු ක්‍රමවේදයක් යොදාගන්නා ලෙස ද තවදුරටත් පැවසීය.

අතිරේක පලාත් අධ්‍යක්ෂක විසින් ගොවියෙකු විසින් අක්කරයක CO3 හා CO4 වර්ගවල තණකොළ වැවීමට ඉල්ලීමක් කල බව ද පැවසීය. අක්කරයක තණකොල වගාව සිදු කරනවනම් ඒ සම්බන්ධ ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස දිසාපතිතුමන් විසින් දැන්විය.

ii. **ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති :**

සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල ආදායම් තත්ත්වය දැක්වෙන දත්තවල පරස්පරතාවක් ඇති බවත් මෙය විධිමත් කිරීමට නිවැරදි ක්‍රමවේදයක් මඟින් දත්ත එකතු කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කරන ලෙසට ඉල්ලීම් කලේය. තව ද අඩු ආදායම්ලාභීන් තේරීමේ දී අවම ආදායම ලෙස රු.12544/- සැලකිය යුතු බවද අවධාරණය කලේය.

සභාපතිතුමන් විසින් කුඹුරු අක්කර 3ක් සහිත පුද්ගලයින් සමෘද්ධි ප්‍රතිලාභ ලේඛනයෙන් ඉවත් කිරීමට ක්‍රමවේදයක් තිබේ ද යන්න විමසූ අවස්ථාවේ දී මේ සම්බන්ධව සුභ සාධන ප්‍රතිලාභ මණ්ඩලය හරහා සමීක්ෂණයක් සිදුකරමින් තිබෙන බවත් ලබන වසර වන විට එය සාර්ථක කර ගැනීමට හැකියාව ඇති බව දිසාපතිතුමන් විසින් පැවසීය.

iii. **වාරි සෞභාග්‍යා ජාතික වැඩසටහන ඇතුලු සියලු වාරි සංවර්ධන වැඩසටහන්**

වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් වාරි සෞභාග්‍යා ජාතික වැඩසටහන යටතේ ව්‍යාපෘති 29ක වැඩ අවසන් බවත් ව්‍යාපෘති 14ක ඉදිකිරීම් තවමත් සිදුවෙමින් පවතින බවත් පැවසීය. සියලුම ව්‍යාපෘති සාර්ථක මට්ටමේ පවතින බව ද දැන්විය.

09. දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය

9.1 සැලසුම් අධ්‍යක්ෂක විසින් දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන ලදි. ඒ අනුව 2022 වර්ෂයේ සියලුම ව්‍යාපෘති 2561ක් වන අතර ඉන් ව්‍යාපෘති 1508ක වැඩ අවසන් බවත් මේ සඳහා මිලියන 667.76 ප්‍රතිපාදන වෙන් වූ බවත් පලමු කාර්තුවේ වියදම මිලියන 230.41ක් බවත් මිලියන 106.69ක් අතැති බිල් පවතින බවත් තවදුරටත් දැන්විය.

9.2 නාගරික සංවර්ධන අධිකාරිය හරහා සිදු වන ව්‍යාපෘති සම්බන්ධව නියෝජ්‍ය අධ්‍යක්ෂ මගින් පැහැදිලි කිරීමක් කල අතර එහි දී 2022/23 වර්ෂයේ දී ආරුගම්බයේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවලට ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස සභාපතිතුමා විසින් ඉල්ලීමක් සිදු කලේය.

9.3 අම්පාර ප්‍රාදේශිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වෛද්‍ය නිලධාරි (සැලසුම්) විසින් ඖෂධවල හිඟයක් පවතින බවත් ඇනීමියා රෝගීන් ප්‍රමාණයේ වැඩි වීමක් පවතින බවත් මේ දිනවල දිස්ත්‍රික්කයේ දරුවන්ගේ මන්දපෝෂණ තත්ත්වය හඳුනා ගැනීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල වල දරුවන්ගේ බර හා උස මැනීම් සිදු කරන බව වැඩිදුරටත් දැන්විය.

9.4 කල්මුණ ප්‍රාදේශිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ වෛද්‍ය නිලධාරි (පෝෂණය) විසින් දරුවන්ගෙන් පස් දෙනෙක්ගෙන් එක් අයෙක් මන්දපෝෂණයෙන් පෙළෙන බව ද පෝෂණය සම්බන්ධයෙන් අධීක්ෂණයක් අවශ්‍ය බව ද පැවසීය.මේ සඳහා ආහාර නිෂ්පාදනය හා ආහාර බහුල කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය පෞද්ගලික සම්බන්ධතාවක් (Public Private Partnership) සඳහා පියවරගත යුතු බව ද තවදුරටත් දැන්විය.

9.5 ලගම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය හරහා සිදු කල ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීම අතැති බිල්පත් ඉතුරුව ඇති බවත් එම ගෙවීම් සම්බන්ධව සභාපතිතුමන් විසින් සොයා බලන බවට දන්වන ලදි.

9.6 අයි - රෝඩ් ව්‍යාපෘතියේ ව්‍යාපෘතීන් දිගටම ක්‍රියාත්මක වන බව ද මෙම මස අයි -රෝඩ් ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡාවක් පැවැත්වීමට දිනයක් ලබා දෙන බව ද සභාපති තුමා විසින් පවසන ලදි.

10. දිස්ත්‍රික්කයේ ආර්ථික, සමාජීය සංවර්ධනයට අදාළව ආයතන මගින් යොමු කර ඇති යෝජනා

| අනු අංකය | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01. | පදියතලාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුල බඩඉරිඟු වගාව දියුණු කිරීම සඳහා යුරෝපා සංගමයේ අරමුදලින් කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලැබුණි |
| 02. | අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලයේ ආදර්ශ ගොවිපලේ ක්‍රියාත්මක ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් ලබා ගැනීම | හාඩි තාක්ෂණ විද්‍යාලයේ ආදර්ශ ගොවිපලේ ක්‍රියාත්මක ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම සඳහා අවශ්‍ය උපකරණ සම්බන්ධව ඉල්ලීමක් සිදු කරන ලෙස අධ්‍යක්ෂකතුමාට දන්වන ලදි. උසස් අධ්‍යාපන අමාත්‍යංශයට යෝජනාව අනුමත කර යොමු කරන බවට පවසන ලදි.<br>අලිවැට නැවත වරක් සකස් කර දෙන ලෙසට වනජීවී දෙපාර්තමේන්තුවට දන්වන ලදි. තව ද අලිවැට නඩත්තුව හාඩි කාර්මික ආයතනය මගින් සිදු කර ගත යුතු බව හාඩි කාර්මික ආයතනයේ අධ්‍යක්ෂකතුමාට දන්වන ලදි. |

## 11.දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු යෝජනා

| අනු අංකය | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මගින් ඉදිරිපත් කල සීමා නිර්ණ යෝජනා සඳහා අනුමැතිය ලබා ගැනීම | මේ පිළිබඳ වැඩි දුරටත් අධ්‍යනය කිරීමට අම්පාර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දෙන ලෙස ද , මීළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී ඒ සඳහා අනුමැතිය ලබා දීමට ද තීරණය විය. |
| 02. | නාවිදන්වේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල වර්ග මීටර් 732.11 ඉඩමෙහි පිහිටි වර්ග මීටර් 561.10 විධාතා ගොඩනැගිලෙන් වර්ග මීටර් 171.03ක කොටසෙහි (උතුර- ප්‍රධාන මාර්ගය, නැගෙනහිර - ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරි කාර්යාලය, දකුණ - විධාතා සම්පත් මධ්‍යස්ථානය, බටහිර - විධාතා සම්පත් මධ්‍යස්ථාන ඉඩම) තාවකාලිකව පවත්වා ගෙන යනු ලබන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගේ ඉල්ලීම පරිදි ස්ථිරව පවත්වාගෙන යාමට අවශ්‍ය අනුමැතිය ලබාගැනීම. | කමිටු අනුමැතිය ලැබුණි |
| 03 | පදියතලාව තලාපිටඹය ග්‍රාමයේ ගල්ගේ කණ්ඩිය ජලාශය ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම | කමිටු අනුමැතිය ලැබුණි |
| 04. | අම්පාර මහ රෝහල ශික්ෂණ රෝහලක් බවට පත් කිරීම | කමිටු අනුමැතිය ලැබුණි.<br>ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය ස්ථාපිත කිරීමට සමගාමීව එම ශිෂ්‍යයන්ට අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීම සඳහා අම්පාර මහ රෝහල ශික්ෂණ රෝහලක් බවට පත් කිරීමට සම්බන්ධ යෝජනාව දිසාපතිතුමාට ඉදිරිපත් කරන ලෙස පැවසීය |

## 12. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර විසඳුම් නොලැබුණු විශේෂ ගැටළු

| අනු අංකය | සාකච්ඡා කළ යුතු කරුණු | තීරණය |
|---|---|---|
| 01. | අම්පාර දිස්ත්‍රික්කයේ වෙරළබඩ ප්‍රදේශයේ පවතින ගුරු හිඟය හා ගුරු ස්ථාන මාරු සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම. | ගුරු ස්ථාන මාරු ගැටලුව පිළිබඳව ලබන මස 03 වන දින අනු කමිටුවක් පවත්වා එමගින් විසඳීමට තීරණය විය.<br>නව පත්වීම් ලද සංවර්ධන නිලධාරීන් ගුරුවරුන් ලෙස නැගෙනහිර පලාතට පමණක් බඳවා ගැනීම සම්බන්ධ යෝජනාව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, දිසාපති තුමා සහ අනෙකුත් අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන්, අධ්‍යාපන ඇමතිතුමා සමඟ පාර්ලිමේන්තුවේ දී සාකච්ඡා කිරීමට තීරණය විය |
| 02. | අක්කරපත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි පලාත් පාසල් නියාමනය කිරීම | පාසල් සම්බන්ධ නමෙහි යම් වෙනස්කම් කිරීමේ දී හෝ වෙන යම් අවශ්‍ය කටයුතු සිදු කිරීමේ දී ප්‍රාදේශීය ලේකම් හරහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු බවට තීරණය විය. |
| 03 | අක්කරපත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සායන මධ්‍යස්ථානය සම්බන්ධ ගැටලු නියාමනය කිරීම. | මෙය විසඳීම සඳහා ප්‍රාදේශීය ලේකම් ප්‍රමුඛව අක්කරපත්තුව ප්‍රාදේශීය සභාවේ සභාපති ,කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී,ප්‍රජා නායකයින් ඇතුළුව කමිටුවක් පත් කල අතර, සති 02ක් තුල කමිටුව පවත්වා වාර්තාවක් ලබා දෙන ලෙසට ප්‍රාදේශීය ලේකම්ට දන්වන ලදි. |
| 04 | නින්දවූර් වෙරළ තීරය දැඩිලෙස ඛාදනයට ලක්වීම. | මේ සම්බන්ධ ගනු ලබන පියවර ඇතුලත් වාර්තාව සභාපතිතුමන් වෙත ලබා දෙන ලෙසට දන්වන ලදි. |

| | | |
|---|---|---|
| 05 | මහා කන්නයේ වගා අස්වැන්න නෙළීම සඳහා ඉන්ධන සපයා ගැනීම | ඉන්ධන සම්බන්ධ ගැටළු වේ නම් දිසාපතිතුමන් හමුවන ලෙස දැනුම් දෙන ලදි. |
| 06 | පුලාවල හා වැම්පිටිය යන ග්‍රාම නිලධාරි වසම් දෙක සඳහා රඹකැන්ඔය ජල යෝජනා ක්‍රමය මඟින් පානීය ජලය ලබාදීම. | මේ සම්බන්ධ දිස්ත්‍රික් කමිටුව මඟින් තීරණයක් ලබා දිය නොහැකි බවත් මේ සම්බන්ධ විකල්ප පිළිතුරක් ලබා දීමට ඉල්ලීමක් මඟින් යොමු කරන ලෙස දන්වන ලදි. |
| 07 | කාර්තිව් බටහිර ප්‍රධාන මාර්ගයේ අනවසරයෙන් පස් හා ගල් අතුරමින් සිදුකරන මාර්ග සංවර්ධන කටයුතු අත්හිටුවීම. | ප්‍රාදේශීය ලේකම්, මාර්ග සංවර්ධන අධිකාරිය හා ප්‍රාදේශීය සභා සභාපති හමු වී එකඟතාවකට පැමිණෙන ලෙසට දැන්විය. මාර්ගයේ සංවර්ධන කටයුතු නොනවත්වන ලෙසට ද දන්වන ලදි. |
| 08. | ඊසානදිග මෝසමට සූදානම්වීමේ දී මුහුණ දීමට සිදුවන ආපදා තත්ත්වය අවම කිරීම සඳහා අවශ්‍ය දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සැලසුම් සකස් කිරීම | මේ සම්බන්ධව Zoom තාක්ෂණය ඔස්සේ සාකච්ඡ කිරීමට නියමිතය. |
| 09 | උක් ගොවීන්ට උක් ටොන් එකක් සඳහා ගෙවනු ලබන මිල සම්බන්ධව | නුදුරේ දී උක් මිල සම්බන්ධව රජයෙන් තීරණය කිරීමට නියමිත බව ගල්ඔය වැවිලි සමාගම මඟින් දන්වන ලදි. |
| 10 | ජයභූමි දීමනාපත්‍ර ඉඩම් හා ඉං.සං.ආ.බලපත්‍ර ඉඩම් බලයලත් මිනින්දෝරු වරු ලවා දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ මැනීමට තිබූ අවස්ථාව මිනින්දෝරු දෙපාර්තමේන්තු චක්‍ර ලේඛණයක් මඟින් අත්හිටුවා තිබීම | මේ සම්බන්ධ දිස්ත්‍රික් කමිටුව මඟින් තීරණයක් ලබා දිය නොහැකි බව දිස්ත්‍රික් මැනුම් අධ්‍යක්ෂ සමඟ සාකච්ඡා කල යුතු බවත් තීරණය විය.තව ද මහජනතාවගේ හදිසි අවශ්‍යතා මත මැනුම් කර දීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති විසින් දැන්විය. |
| 11 | ලංකා විදුලිබල මණ්ඩලයේ මහඔය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සඳහා ඉඩමක් ලබා ගැනීම | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන් විසින් මැදිහත් වී මෙම ගැටළුවට විසඳුමක් ලබා දෙන බවට පැවසීය |
| 12 | බුදුරාපොත - රඹකැන්ඔය යෝජිත විදුලි වැටේ ඉදිකිරීම් ප්‍රමාදවීම | ලබන වසර වන තෙක් සියලුම ව්‍යාපෘතිවල වැඩ අත්හිටුවා ඇති බවත් ලබන වසරේ ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතිවල ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරන බවත් මෙම ව්‍යාපෘතිය එයට ඇතුලත් කරන බවත් දැන්විය |
| 13 | මහියංගනේ සිට පොල්ලේබැද්ද දක්වා ධාවනය වූ ලංගම බස්රථය නැවත ධාවනය කරන ලෙස ඉල්ලීම | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති තුමන් විසින් මේ පිළිබඳ අවධානය යොමු කරන බවට පැවසීය. |
| 14 | එක්ගල්ඔය YSS භූමි ප්‍රදේශය මිරිස් ඇතුළු අතිරේක බෝග නිෂ්පාදනය සඳහා පමණක් වෙන් කර ලීම | කමිටු අනුමැතිය ලැබුණි.ඉඩම නැවත ලබා දෙන ලෙසට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති තුමන් විසින් ගල්ඔය වැවිලි සමාගමට දැන්විය.එහි දී දැනට උක් වගා කර ඇති භූමියේ පමණක් උක් වගාවට අවසර දීමට එකඟ විය. |

**13.** වෙනත් : මීලඟට පවත්වනු ලබන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් සඳහා තීරණ ගත හැකි වගකිවයුතු නිලධාරීන් සහභාගීවීම අනිවාර්ය වන බවත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් දිනට පළාත් සභාවේ වෙනම රැස්වීම් නොපැවැත්වීමට කටයුතු කරන ලෙසටත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් දන්වන ලදි.

14. ස්තුති කථාව : දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු. ඩබ්.ඩී.වීරසිංහ මැතිතුමා විසින් පැමිණි සිටි සියලු දෙනාට ස්තුති කර රැස්වීම අවසන් කරන ලදි.

ජේ.එම්.ඒ. ඩග්ලස් ,
දිස්ත්‍රික් ලේකම්
අම්පාර

ජේ.එම්.ඒ. ඩග්ලස්
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය